# ‘තියටර් සෙවන් ළමා නාට්‍ය ඇගයීම2023’

බස්නාහිර පළාත් සභා පාසල් සඳහා

විස්තර සහ පොදු නීති

(විදුහල්පතිවරුන් සහ අයදුම්කරුවන් සඳහා)

ඉදිරිපත් කිරීම

බස්නාහිර පළාත් අධ්‍යාපන සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍යාංශය

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සහ

තියටර් සෙවන් රඟහල

බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය

කොළඹ 07

## ‘තියටර් සෙවන් ළමා නාට්‍ය ඇගයීම 2023’ (සිංහල මාධ්‍ය)

### අරමුණ

නාට්‍ය හා රංග කලාව පිළිබඳ ප්‍රායෝගික සහ විෂයානුබද්ධ අත්දැකීම් රාශියක් පාසල් අධ්‍යාපනය හදාරණ දරුවන්ට ලබාදීමත්, සිසුන් සහ ගුරුවරුන් නිර්මාණකරණයට යොමු කිරීමත් ඔවුන්ගේ නාට්‍ය රසඥතා හැකියාවන් වර්ධනය කොට වින්දන ශක්තීන් දියුණු කිරීමත් කුසලතා පූර්ණ දරුවන්ගේ නිර්මාණ සමාජගත කිරීමට අවස්ථාව උදාකර දීමත් දරුවන්ගේ සෞන්දර්යාත්මක ආකල්ප දියුණු කිරීමත් දරුවන්ට නාට්‍ය ක්ෂේත්‍රයේ විවිධ වෘත්තීන්හි පුහුණුවක් ලබා දීමත් අපේක්ෂා කෙරේ.

පාසල්වල දැනට ක්‍රියාත්මකවන විෂය මාලාවෙහි නාට්‍ය හා රංග කලා විෂය 6 ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා ම ඇතුළත්ව ඇති බැවින් මෙම ඇගයීම සංවිධානය කිරීමෙන් එම විෂය සංවර්ධනය සඳහා සුවිශේෂී දායකත්වයක් ලැබෙනු ඇත. සිසුන් තුළ යහපත් ආකල්ප පෝෂණය කරමින් ජාතියේ සංවර්ධනය අරමුණු කොට ගෙන සිසු දරු දැරියන්ගේ පෞරුෂය සංවර්ධනය කිරීම උදෙසා ද මෙම ඇගයීමදායක වේ. අවසාන වටයේ තේරී පත්වන නාට්‍ය කණ්ඩායම් සඳහා නාට්‍ය ක්ෂේත්‍රයේ විවිධ අංග ඔස්සේකුසලතා දක්වන දරුවන්හට ත්‍යාග ප්‍රදානයක් ද සිදුකිරීමට නියමිත ය.

නාට්‍ය ඇගයීම පිළිබඳ පොදු නීති

1. 2023 වර්ෂයේ නාට්‍ය ඇගයීම පැවැත්වෙනුයේ සිංහල මාධ්‍යයෙනි.
2. බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින රජයේ පාසල්වල 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරණසිසුන්ට පමණක් ඔවුන්ගේ ගුරුභවතුන්ගේඅධීක්ෂණය යටතේ තරගය සඳහා සහභාගී විය හැකි ය.
3. ‘තියටර් සෙවන් ළමා නාට්‍ය ඇගයීම 2023’ අංශ 2කින් සහ වට 3කින් සමන්විත ය.
4. නාට්‍ය ඇගයීම අංශ 2ක් යටතේ සිදුකෙරේ.
   4.1 ප්‍රාථමික අංශය
      1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා දරුවන්
      සියලුම ප්‍රාථමික පාසල් මෙම අංශයේ ඇගයීම සඳහා සහභාගී වීම අපේක්ෂා කෙරේ.
   4.2 ද්විතීයික අංශය
      6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා දරුවන්
      ප්‍රාථමික නොවන සියලුම පාසල් මෙම අංශයේ ඇගයීම සඳහා සහභාගී වීම අපේක්ෂා කෙරේ.
      ද්විතීයික අංශයෙන් ඉදිරිපත්වන නාට්‍ය කණ්ඩායමකට අවශ්‍ය නම් එම විදුහලේ ම ප්‍රාථමික අංශයේ දරුවන් ද සහභාගී කරවා ගැනීම සඳහා අවසරය ඇත.
5. ප්‍රාථමික සහ ද්විතීයික අංශ වෙන වෙන ම ඇගයීමට ලක්කරන අතර එක් එක් අංශයන් සඳහා වෙන වෙන ම ස්ථානයන් තෝරා ත්‍යාග, සම්මාන සහ සහතිකපත් ලබා දීම සිදුකෙරේ.
6. මතු දැක්වෙන මාතෘකා යටතේ කාලීන සමාජයට වැඩදායී තේමාවක් පදනම් කරගනිමින් නාට්‍යය නිර්මාණය කළ යුතු අතර සෑම නාට්‍යයක් ම ස්වතන්ත්‍ර නිර්මාණයක් විය යුතු ය.
   1. සාරධර්ම සුරකිමු
   2. සහජීවනයේ වැදගත්කම
   3. පරිසරය අපට
   4. ළමා ලෝකයට ඉඩ දෙන්න
   5. වැඩිහිටියනි අප දෙස බලන්න
7. කෙටි නාට්‍ය පමණක් තරගයට ඉදිරිපත් කළ හැකි අතර නාට්‍යයේ කාල සීමාව විනාඩි 15-30 අතර විය යුතු ය.

8. පාසල් විෂය ධාරාව හදාරණ 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසු දරුදැරියන්හට පමණක් මෙම නාට්‍ය ඇගයීම සඳහාදායකත්වය සැපයිය හැකි ය.

8.1 දරුවන්ට නාට්‍ය ක්ෂෙත්‍රයේ ඇති වෘත්තීන් පුහුණු කරනු පිණිස ගුරුභවතකුගේ අධීක්ෂණය යටතේ පහත දැක්වෙන නිර්මාණ ශීර්ෂ කෙරෙහි අවධානය යොමු කිරීමක් අපේක්ෂා කෙරේ.

- පිටපත් රචනය
- වේදිකා පසුතල නිර්මාණය
- අංග රචනය
- ආලෝකකරණය
- රංගවස්ත්‍ර සහ රංගාභරණ නිර්මාණය
- සංගීතය
- වේදිකා පරිපාලනය
- අධ්‍යක්ෂණය

9. අනන්‍යතාව තහවුරු කිරීම

9.1 අනන්‍යතාව තහවුරු කිරීමට අවශ්‍ය වූ විටෙක සෑම සහභාගීවන්නෙකු ම පිළිගත් හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීමට සෑම අවස්ථාවක දී ම සූදානමින් සිටිය යුතු ය.

9.2 වයස අවුරුදු 6ත් 19ත් අතර පාසල් අධ්‍යාපනය හදාරණ දරුවන්ට ඇගයීම සඳහා සහභාගී විය හැකි අතර ජාතික හැඳුනුම්පත හෝ තැපැල් හැඳුනුම්පත නොමැති සිසුන්ගේ අත්සන සහිත ඡායාරූපය අදාළ විදුහල්පති විසින් සහතිකකොට තිබිය යුතු ය.

9.3 අනන්‍යතාව තහවුරු කිරීමට අපොහොසත්වන්නන් තරගයෙන් ඉවත් කිරීමට සිදුවනු ඇත.

10. තරගයේ අවස්ථා

10.1 මෙම තරගය අවස්ථා 03කින් පමණක් සමන්විත වේ.එය ප්‍රාථමික සහ ද්විතීයික යන අංශ දෙකට ම එක සේ බලපායි.

10.2 එය පහත පරිදි වට 3කින් නිරූපණය වේ.

10.2.1 පළමු වටය

- පළමු වටයේ දී තරග සඳහා ලබා දී ඇති අවසාන දිනය දක්වා බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය වෙත ගෙන්වා ගනු ලබන නාට්‍ය පිටපත් බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය විසින් නම් කරනු ලබන විනිශ්චය මණ්ඩලයක් වෙත යොමු කෙරෙන අතර ඒවායින් දෙවන වටයට යෝග්‍ය පිටපත් තෝරා ගැනීම සිදු කෙරේ. තෝරා ගන්නා ලද පිටපත් පිළිබඳව අදාළ පාසල හෝ අධ්‍යාපන ආයතනය දැනුවත් කරනු ලබන අතර නිශ්චය කරනු ලබන දිනයක දී සහ ස්ථානයක දී එම නාට්‍යය ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතු ය.
- දෙවන වටයට සුදුසුකම් නොලබන එහෙත් දක්ෂතා දක්නට ලැබෙන අත්පිටපත් සඳහා ද විනිශ්චය මණ්ඩල විශේෂ ඇගයීම් යටතේ කුසලතා සහතිකපත් හිමිවිය හැකි ය.
- එසේ ම එවනු ලබන සෑම අත්පිටපතක් සඳහා ම සහභාගීත්ව සහතිකයක් පිරිනැමේ.
- පළමු වටයේ දී අත්පිටපත් පරීක්ෂාකර දෙවන වටය සඳහා යෝග්‍ය පිටපත් තෝරා ගැනීම් කටයුතු සඳහා විනිශ්ච මණ්ඩලයේ සාමාජිකයන් වෙත ගෙවීමක් සිදුකෙරේ. නියමිත අවසන් දිනයට පෙර සංවිධායක මණ්ඩලය වෙත අදාළ තේරීම් කටයුතු නිමවා ප්‍රතිඵල ලබා දීමට විනිශ්චය මණ්ඩලය කටයුතු කළ යුතු ය.

10.2.2 දෙවන වටය

- දිස්ත්‍රික්ක ත්‍රිත්වයේ කේන්ද්‍රස්ථාන ලෙස පිළිගත් ස්ථානයන්හි දෙවන වටයට තෝරාගන්නා ලද නාට්‍ය විනිශ්චය මණ්ඩලය මගින් නරඹා සුදුසුකම් ලබන නාට්‍ය අවසාන වටයට තෝරා ගැනීම සිදුවේ.
- අවසාන වටයට තෝරා නොගත් එහෙත් දක්ෂතා දක්නට ලැබෙන නාට්‍ය සඳහා ද විනිශ්චය මණ්ඩල විශේෂ ඇගයීම් යටතේ කුසලතා සහතිකපත් හිමිවිය හැකි ය.
- නාට්‍යය සඳහා ගින්දර, රසායන ද්‍රව්‍ය හෝ වෙනත් අන්තරායකර ද්‍රව්‍ය භාවිතය තහනම්වන අතර අවශ්‍ය පහසුකම් අයදුම්කරුවන් විසින් සපයාගත යුතු ය.

10.2.3 තෙවන වටය

- තෙවන වටය සඳහා තෝරා ගන්නා ලද නාට්‍ය නිර්මාණ විනිශ්චය කරනු ලබන්නේ කොළඹ 07, බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ තියටර් සෙවන් රඟහලේ දී ය.
- සුදුසුකම් ලැබූ නාට්‍ය තමන්ට නියමිත දිනයේ දී නියමිත වේලාවට විනිශ්චය සඳහා ඉදිරිපත් කළ යුතු ය.
- නාට්‍යය සඳහා ගින්දර, රසායන ද්‍රව්‍ය හෝ වෙනත් අන්තරායකර ද්‍රව්‍ය භාවිතය තහනම්වන අතර අවශ්‍ය නම් විදුලි සැපයුම ලබාගත හැකි ය.සෙසු අවශ්‍යතාවන් අයදුම්කරුවන් විසින් සපුරාගත යුතු ය.
- තෙවන වටයෙන් තෝරා නොගත් එහෙත් දක්ෂතා දක්නට ලැබෙන නාට්‍ය සඳහා ද විනිශ්චය මණ්ඩල විශේෂ ඇගයීම් යටතේ කුසලතා සහතිකපත් හිමිවිය හැකි ය.
- තෙවන වටයේ නාට්‍ය ඇගයීම දින තුනක දී සිදුකිරීමට නියමිත ය.එය නැරඹීම සඳහා තරගයට සහභාගී වූ සියලුම පාසැල්වෙත හැකියාව ඇති අතර මහජනතාවට ද ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂා කෙරේ.
- නාට්‍ය නැරඹීම සඳහා කිසිදු මුදලක් අය නොකෙරේ.

10.2.4 අවසාන වටයෙන් පසු තෝරා ගන්නා ලද නාට්‍ය සඳහාත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය කිරීම කොළඹ 07, බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ තියටර් සෙවන් රඟහලේ දී පසු ව තීරණය කරනු ලබන දිනයක දී පැවැත්වීමට කටයුතු කෙරේ.

10.2.5 ජයග්‍රාහී නාට්‍ය දිවයිනේ සුප්‍රසිද්ධ රූපවාහිනී නාලිකාවක් විසින් පටිගත කරනු ලබන අතර පසුව එය අදාළ නාලිකාව ඔස්සේ විකාශය කිරීමට ද සැලසුම් කර ඇත.

10.2.6 අවසන් වටයේ නාට්‍ය ඇගයීම සිදුකරනු ලබන දිනයන්හි එම කාර්යයට සමගාමී ව දරුවන් සඳහා විශේෂිත වූ විනෝදාස්වාදාත්මක වැඩසටහන් කීපයක් බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පරිශ්‍රයේ දී සිදුකිරීමට නියමිත ය.

11. තිළිණ සහ සහතිකපත් ප්‍රදානය

11.1.1 ජයග්‍රහණ ලබා ගන්නා සියලු ම දරුවන් වෙත සහතික පත්‍ර සහ ත්‍යාගයන් පිරිනැමීම බස්නාහිර පළාත් අධ්‍යාපන සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍යාංශය, බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය විසින් සිදුකරනු ඇත.

11.1.2 කිසිදු ශීර්ෂයක් සඳහා සම ස්ථාන ලබා නොදේ. අත්පිටපතේ සිට නාට්‍ය ඉදිරිපත් කිරීම දක්වා සමස්තය ඇගයීමට ලක්කිරීමෙන් අනතුරු ව විනිශ්චය මණ්ඩලය අවසන් වටයේ ජයග්‍රාහී ස්ථාන ප්‍රකාශයට පත් කරනු ඇත. පහත 12.1.4හි විස්තර කරනු ලබන පරිදි ජයග්‍රාහක ස්ථාන ප්‍රකාශ කිරීමට අපේක්ෂිත ය.

11.1.3 ජයග්‍රහණය කරනු ලබන කණ්ඩායම් සහ ජයග්‍රහණ නොලබන එහෙත් විනිශ්චය මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන කණ්ඩායම් බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ නාට්‍ය අංශයේ සාමාජිකයන් ලෙස බඳවා ගැනෙන අතර නාට්‍ය හා රංග කලාව පිළිබඳ වැඩිදුර පුහුණුවක් ඔවුන් වෙත ලබා දීමට ද අපේක්ෂා කෙරේ.

11.1.4 ඒ ඒ ශීර්ෂයන්හි සුවිශේෂතාවයන්ට අදාළ ව පහත සඳහන් පරිදි සහතික පත්‍ර සහ/හෝ ත්‍යාගයන් පිරිනැමේ.

ප්‍රාථමික අංශය සඳහා ත්‍යාග, සම්මාන සහ සහතිකපත් ප්‍රදානය

| අනු අංකය | කුසලතාව | 1 ස්ථානය | 2 ස්ථානය | 3 ස්ථානය |
|---|---|---|---|---|
| 01 | හොඳම නාට්‍යය | රු. 50,000/- සම්මානය සහ සහතික පත්‍ර | රු. 30,000/- සහතික පත්‍ර | රු. 20,000/- සහතික පත්‍ර |
| 02 | හොඳම නාට්‍ය පෙළ රචනය | රු. 30,000/- සම්මානය සහ සහතික පත්‍ර | රු. 20,000/- සහතික පත්‍ර | රු. 10,000/- සහතික පත්‍ර |
| 03 | හොඳම භූමිකා රංගනය - පිරිමි | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 04 | හොඳම භූමිකා රංගනය - ගැහැණු | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 05 | හොඳම රංග වස්ත්‍රාභරණ නිර්මාණය | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 06 | හොඳම වේදිකා පසුතල නිර්මාණය | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 07 | හොඳම ආලෝකකරණය | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 08 | හොඳම සංගීත නිර්මාණය | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 09 | හොඳම රංග වින්‍යාසය | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 10 | හොඳම වේදිකා පරිපාලනය | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 11 | ඇගයීම් මණ්ඩලයේ විශේෂ කුසලතා ඇගයීම් | සහතික පත්‍ර | | |

### ද්විතීයික අංශය සඳහා ත්‍යාග, සම්මාන සහ සහතිකපත් ප්‍රදානය

| අනු අංකය | කුසලතාව | 1 ස්ථානය | 2 ස්ථානය | 3 ස්ථානය |
|---|---|---|---|---|
| 01 | හොඳම නාට්‍යය | රු. 50,000/- සම්මානය සහ සහතික පත්‍ර | රු. 30,000/- සහතික පත්‍ර | රු. 20,000/- සහතික පත්‍ර |
| 02 | හොඳම නාට්‍ය පෙළ රචනය | රු. 30,000/- සම්මානය සහ සහතික පත්‍ර | රු. 20,000/- සහතික පත්‍ර | රු. 10,000/- සහතික පත්‍ර |
| 03 | හොඳම භූමිකා රංගනය - පිරිමි | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 04 | හොඳම භූමිකා රංගනය - ගැහැණු | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 05 | හොඳම රංග වස්ත්‍රාභරණ නිර්මාණය | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 06 | හොඳම වේදිකා පසුතල නිර්මාණය | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 07 | හොඳම ආලෝකකරණය | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 08 | හොඳම සංගීත නිර්මාණය | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 09 | හොඳම රංග වින්‍යාසය | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 10 | හොඳම වේදිකා පරිපාලනය | රු. 10,000/- සම්මානය සහ සහතික පත්‍ර | සහතික පත්‍ර | සහතික පත්‍ර |
| 11 | ඇගයීම් මණ්ඩලයේ විශේෂ කුසලතා ඇගයීම් | සහතික පත්‍ර | | |

12. අයදුම් කිරීම

12.1.1 සෑම නිර්මාණයක් ම "තියටර් සෙවන් ළමා නාට්‍ය ඇගයීම 2023" සඳහා කරන ලද නව නිර්මාණයක් විය යුතු ය.

12.1.2 එක් පාසලකින් එක් නිර්මාණයක් පමණක් ඉදිරිපත් කළ හැකි ය.

12.1.3 අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී ඉතා පැහැදිලි අකුරින් එය සිදුකිරීම අත්‍යවශ්‍ය වේ.

12.1.4 ඉදිරිපත් කරන නාට්‍යවල පිටපත් A4 කඩදාසිවල සම්මත නාට්‍ය පිටපත් ආකෘතියට අනුව පිටුවේ අවකාශය බෙදා ගනිමින්, පොයින්ට් 12 අක්ෂර ප්‍රමාණයෙන් පරිගණක යතුරු ලියනය කොට තිබීම අනිවාර්ය වේ. මුද්‍රණය කිරීමෙන් අනතුරුව අක්ෂර දෝෂ ඇත්නම් ඒවා පරීක්ෂා කොට නිවැරදිකර එවිය යුතු ය.

12.1.5 **නාට්‍ය අත්පිටපතේ පාසල පිළිබඳ කිසිදු තොරතුරක් ඇතුළත් නොකළ යුතු** අතර අයදුම්පතෙහි සියලු විස්තර සඳහන්කර නාට්‍ය අත්පිටපත සමග ඉදිරිපත් කළ යුතු ය.

12.1.6 අයදුම්පත මේ සමග අමුණා ඇත

12.1.7 විදුහල්පති විසින් සහතික කරන ලද අයදුම්පත් සහ නාට්‍ය අත්පිටපත් ඒ සඳහා ලබා දී ඇති අවසාන දිනයට හෝ ඊට පෙර පහත ලිපිනයට තැපැලෙන් එවිය යුතු ය. නැතහොත් ගෙනැවිත් භාර දිය හැකි ය.

සභාපති,
තියටර් සෙවන් රඟහල
බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය,
275/74, ස්ටැන්ලි විජේසුන්දර මාවත,
කොළඹ 07

12.2 ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. විනය සහ ආරක්ෂාව

එක් එක් අවස්ථාවට සහභාගීවීම සඳහා මධ්‍යස්ථානවලට කැඳවාගෙන එන සිසුන්ගේ ආරක්ෂාව, විනය හා භාරකාරත්වය පිළිබඳව විදුහල්පතිවරුන්ගේ සහ කණ්ඩායම්භාර ගුරුවරුන්ගේ විශේෂ අවධානය යොමු විය යුතු ය.

14. ඉදිරි දැක්ම

- "තියටර් සෙවන් ළමා නාට්‍ය ඇගයීම 2023" පවත්වනු ලබන්නේ ප්‍රථම වතාවට ය. එය සෑම වර්ෂයක් පාසා ම අඛණ්ඩව පැවැත්වීමට නියමිත ය.
- එසේ ම ආරම්භක වර්ෂයේ දී සිංහල මාධ්‍ය නාට්‍ය පමණක් ඇගයීමට කටයුතු කරන අතර ඉදිරියේ දී සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍ය ත්‍රිත්වයෙන් ම පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

15. සහභාගීත්වය

බස්නාහිර පළාත් රාජ්‍ය පාසල්වල සිසුන් පමණක් මෙම නාට්‍ය ඇගයීම සඳහා සුදුසුකම් දරණ අතර නාට්‍ය හා රංග කලා විෂය ඉගැන්වෙන පාසල්වල සිසුන් මෙම වැඩසටහනට සහභාගී වීම අනිවාර්යයෙන් ම අපේක්ෂා කෙරේ. ඔවුන් දිරිමත් කිරීම අනුග්‍රහ දැක්වීම සහ අවශ්‍ය පහසුකම් සලසා දීම ගුරුභවතුන්, විදුහල්පතිවරුන් ඇතුළු අධ්‍යාපන අංශ ප්‍රධානීන්ගෙන් අපේක්ෂා කෙරේ.

16. ප්‍රතිපෝෂණය

- "තියටර් සෙවන් ළමා නාට්‍ය ඇගයීම 2023" අවසානයේ දී ඊට සහභාගී වී කුසලතා පෙන් වූ දරුවන්හට නාට්‍ය හා රංග කලාව සම්බන්ධයෙන් තම තමන්ගේ කුසලතා තවදුරටත් ඔප් නංවා ගැනීම සඳහා ප්‍රතිපෝෂණය කිරීමක් බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය විසින් සිදුකරනු ලැබේ.

- එහිදී මෙම නාට්‍ය ඇගයීම සඳහා දායක වූ දරුවන් සඳහා නාට්‍ය පුහුණු පාඨමාලාවන් සහ වැඩමුළු කීපයක් පැවැත්වීමට නියමිත ය. එම වැඩමුළු සහ පුහුණු පාඨමාලාවන් බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ " අපේ දරුවන් වෙනුවෙන් අපි" ව්‍යාපෘතිය යටතේ සිදුකිරීමට නියමිත ය.

- "තියටර් සෙවන් ළමා නාට්‍ය ඇගයීම 2023" සඳහා දායක වූ කුසලතා පූර්ණ දරුවන් තියටර් සෙවන් රඟහලේ කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ට නාට්‍ය ශිල්පීන්ගේ සංචිතයට ඇතුළත් කිරීමට නියමිත ය.
- ටෙලිනාට්‍ය සහ සිනමාව සඳහා ශිල්පීන් තෝරාගනු ලබන වැඩසටහන්වල දී බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය නියෝජනය කරමින් ඉදිරිපත්වීම සඳහා අවස්ථාව එම දරුවන් වෙත හිමි වේ.
- එසේ ම, බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය මගින් හඳුන්වාදෙන සේවාවන් ලබා ගනිමින්, එහි ඉදිරි වැඩසටහන්වලට සහභාගී වෙමින් සහ ආයතනය සමග අත්වැල් බැඳ ගනිමින්කටයුතු කිරීම සියලු ම පාසල් වෙතින් අපේක්ෂා කෙරේ.

17. ව්‍යාපෘති කාල සටහන

| | |
|---|---|
| ප්‍රචාරණ කටයුතු ආරම්භය | : 2023 පෙබරවාරි 20 |
| අත්පිටපත් භාර ගැනීමේ අවසන් දිනය | : 2023 මාර්තු 31 |
| දෙවන වටයේ ඇගයීම් | : 2023 අප්‍රේල් 24 සිට 28 දින දක්වා |
| තෙවන වටයේ ඇගයීම් | : 2023 මැයි 17,18, සහ 19 යන දිනයන්හි |
| ත්‍යාග ප්‍රදානය | : 2023 මැයි 25,26,30 හෝ 31වන දින |

18. මෙහි සඳහන් ඕනෑම කරුණක් සම්බන්ධව අවසාන තීරණය කොළඹ 07, බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ පාලන අධිකාරිය සතු ය.